# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2206/20 - 2020 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා - 2020.12.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන නියමය

එල්.ඩී.බී. 21/78 (xv) (අ).

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා, මෙම නියමය මගින් 2019 ජුනි මස 03 වන දින අංක 2126/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත, 1996 මාර්තු මස 27 වන දින අංක 916/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය පිහිටුවීමට අදාළ, එකී පනතේ 21 වන වගන්තිය යටතේ වූ එකී නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දක්වෙන "ව්‍යවහාරික විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වන තීරයේ "(ඇ) රසායන විද්‍යා අධ්‍යයන අංශය" යන අයිතමයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන්, එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඉ) පරිගණක විද්‍යා අධ්‍යයන අංශය".

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දී ය.


1A - G 33348 — 521 (2020/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.